**ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 24 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

---

විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

----------

## 2.1 විසර්ජන ගිණුම

------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 196.90 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 194.16 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2.74 ක් හෙවත් සියයට 1.39 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 194.60 | 192.43 | 2.17 | 1.12 |
| මූලධන | 2.30 | 1.73 | 0.57 | 24.78 |
| **එකතුව** | **196.90** | **194.16** | **2.74** | **1.39** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 24501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.78 | 1.65 | 1.50 | 1.97 | 13.00 | 7.64 |

## 2.3 විගණන නිරීක්ෂණය

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යෑම සඳහා අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 විසර්ජන ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.300,000 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා වර්ෂය අවසාන වන විට උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් වී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.334,718 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.2 ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම්

1997 ජූලි 16 දින හා 1998 මැයි 20 දින පිළිවෙලින් අංක 64 හා 13 දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව අත්තිකාරම් ගිණුම් කාර්යයන් දෙකක ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි. පහත සඳහන් අත්තිකාරම් කාර්යයන් දෙකෙහි ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු හැකිතාක් කෙටි කාලපරිච්ඡේදයක් තුළ අවසන් කළ යුතුව තිබුණි.

**3.2.1 වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීමේ දෙපාර්තමේන්තුවේ විෂය අංක 0999-08 දරන පාලන වියදම් ඇතුළුව රබර්, තේ, පොල්, නිෂ්පාදන අනෙකුත් වෙළෙඳ ද්‍රව්‍ය හා පෝර්මික් සහ ඇසිටික් අම්ල මිලට ගැනීම හා විකිණීම පිළිබඳ අත්තිකාරම් ගිණුම**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 518(3) ප්‍රකාර වර්ෂ දෙකක් තුළදී ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු නිම කළ යුතු වුවද, වර්ෂ 19 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද, යථෝක්ත අත්තිකාරම් ගිණුමේ ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව, අත්තිකාරම් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.83,925,299 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.59,292,299 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු .24,633,000 ක වෙනසක් විය.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට රු. 89,879,747 ක් වූ සමුච්චිත කාරක පාඩුව කපා හැරීම සඳහා 2013 මාර්තු 19 දින පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණි. ඉන් එකතුව රු.30,587,448 ක් 2013 වර්ෂයේදී හා 2014 දෙසැම්බර් 31 දින දෙපාර්තමේන්තුවේ ඉතිරි වී තිබුණු ප්‍රතිපාදන උපයෝගී කර ගෙන කපා හැර තිබුණි. තවදුරටත් පවතින රු.59,292,299 ක පාඩුව කපා හැරීම සඳහා 2016 අප්‍රේල් 03 දින දෙපාර්තමේන්තුව විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ඉල්ලා තිබුණ ද, 2016 ජුනි 15 දින වන විටත් එම පාඩුව කපා හැරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වීම නිසා අත්තිකාරම් කාර්යයේ ගනුදෙනු බේරා වසා දැමීමට නොහැකි වී තිබුණි.

**3.2.2. අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දේශීය හා අනෙකුත් නිෂ්පාදන මිලදී ගැනීම, එක් රැස් කිරීම හා අලෙවිය, ශීත ගබඩා පහසුකම් සැපයීම හා ආරෝග්‍ය ශාලා පහසුකම් සැපයීම සඳහා වූ විෂය අංක 999/407 දරන අත්තිකාරම් ගිණුම**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 518(3) ප්‍රකාරව වසර දෙකක් තුළදී ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු නිම කළ යුතු වුවද ,සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 26 ක කාලයක් ගත වී තිබුණද, අත්තිකාරම් කාර්යයේ ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි.

(ආ) රජයේ ඉඩම් ආඥා පනතේ (අධිකාරිය 454) (1) 6 වැනි වගන්තිය යටතේ විශේෂ දීමනා පත්‍රය ප්‍රකාරව පැවරූ වත්කම නාගරික සංවර්ධන අධිකාරිය තම උපයෝගී කාර්යයන්ගෙන් බැහැරව යොදවා ඇත්නම් නැවත එම දේපල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පවරා ගත යුතු වුවද, එම දේපල සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව, භාණ්ඩාගාර බලයලත් අත්තිකාරම් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.222,860,785 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.222,681,406 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.179,379 ක වෙනසක් පැවැතුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට රු.222,681,022 ක් වූ සමුච්චිත කාරක පාඩුව කපා හැරීම සඳහා 2013 මාර්තු 19 දින පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අනුමැතිය ලබා දී

තිබුණි. 2016 අප්‍රේල් 03 දින දෙපාර්තමේන්තුව විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ඉල්ලා තිබුණ ද 2016 ජුනි 05 දින වන විටත් එම කාරක පාඩුව කපා හැරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. මේ නිසා මෙම අත්තිකාරම් කාර්යයේ ගනුදෙනු බේරා කටයුතු නිම කිරිමට නොහැකි වී තිබුණි.

## 3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | රු. | |
| 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතෙහි 4 (උ) සහ (එ) වගන්ති | | පළාත් සභා විසින් ඉදිරිපත් කර තිබුණු උපලේඛනය අනුව මඩකලපුව මහ නගර සභාවට අදාළව රු.11,897,715 ක මුද්දර බදු 2015 දෙසැම්බර් 31 දින වන විටත් නගර සභාව වෙත ගෙවා නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 2009 අගෝස්තු 26 දිනැති අංක 15/ 2009 දරන චක්‍රලේඛය | | සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් චක්‍රලේඛ 04 ක් ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කර තිබුණි. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එම චක්‍රලේඛය සිංහල හා දෙමළ භාෂාවලින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවෙන් ලබා ගැනිමට නොහැකි විය. |
| **(ඇ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ** | | |
| (i) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක්‍ර.අ.01/2010/01 දරන චක්‍රලේඛයේ හා 2015 මැයි 15 දිනැති අංක මු.අ.01/ 2015/01 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | ඩොලර් 1690 | විදේශ රාජ්‍ය/ප්‍රදායක ආයතනය මඟින් එතෙරදී දරනු ලබන ගමන් වියදම්, දුරකථන ගාස්තු වැනි අනියම් වියදම් පියවා ගැනීම සඳහා කිසියම් මුදලක් නොගෙවන විටදී පමණක් ගෙවිය යුතු අනියම් දීමනාව එසේ විදේශ රජය/ආයතනය මඟින් ගෙවා තිබූ අවස්ථා 9 කදී නිලධාරීන් 06 කට ඒ පිලිබඳව නොසලකා සම්පූර්ණ මුදල ලෙස ඩොලර් 1690 ක් ගෙවීම් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක්‍ර.අ.01/2010/01 චක්‍රලේඛයේ 06 (v) ඡේදය | - | නිලධාරිනියක් 2015 මාර්තු 19 දින සිට 2015 අප්‍රේල් 07 දින දක්වා චිනයේ පැවති Seminar on Infrastructure Construction & Planning for Sri Lanka. වැඩමුළුවට සහභාගී වී තිබුණි. එම විදේශගතවී දින 15 ක් ඉක්මවා තිබුණත්, ඒ සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. නිලධාරිණිය විසින් මෙම විදේශගත වීම වෙනුවෙන් අනියම් දීමනා ලෙස එක්සත් ජනපද ඩොලර් 1,025 ක් හා උණුසුම් ඇඳුම් දීමනා වෙනුවෙන් එක්සත් රාජධානියේ පවුම් 75 ක වියදම් ප්‍රතිපූර්ණය කර ගෙන තිබුණි. |

**3.4 කාර්යසාධනය**

-----------------

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිලිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) 2013 අයවැය යෝජනා අනුව මුදල් රෙගුලාසි සංග්‍රහය සංශෝධනය කිරීමේ කාර්යය මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබූ අතර ඒ අනුව 2013 වර්ෂයේ සිට අඛණ්ඩව වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම්වල මෙම කාර්යය ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යය ක්‍රියාත්මක තත්ත්වයට පත් කර නොතිබුණි.

(ආ) 1992 අගෝස්තු 13 දිනැති අංක 2/92 දරන රාජ්‍ය දූත මණ්ඩල චක්‍රලේඛයේ විධිවිධාන පරිදි, ලංකාවේ සිටින විදේශීය රාජ්‍ය නියෝජිත ආයතනයන්හි නිලධාරීන් සිය රාජකාරී කටයුතු සඳහා මෙරටට ආනයනය කරනු ලබන වාහන ඔවුන් නැවත සිය මව්බිම බලා යාමේදී දේශීය වෙළඳපළ තුළ විකුණනු ලබයි. එහිදී රජයට ගෙවිය යුතු තීරුබදු මුදල පිළිබඳ කටයුතු කිරීම සඳහා දෙපාර්තමේන්තුව අතරමැදියකු වශයෙන් ක්‍රියාකර ඇති අතර ඒ අනුව විකිණීම සඳහා ඉල්ලීම් කරනු ලබන එක් වාහනයක් වෙනුවෙන් රු.295 ක ගාස්තුවක් පමණක් දෙපාර්තමේන්තුව විසින් අයකරනු ලබයි. ඉහත කී චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බැවින් ඊට අදාල චක්‍රලේඛය සංශෝධනය කිරීමත්, අය කළ යුතු ගාස්තුව රු.1,000 දක්වා වැඩි කර රාජ්‍ය ආදායම වැඩි කිරීම පිළිබඳව 2012 වර්ෂයේ සිට මුදල් අමාත්‍යාංශයේ අවධානය යොමු වී තිබුණද, ඊට අදාළව සමාලෝචිත වර්ෂයේදී කිසිදු ඉදිරි පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) 2006 දෙසැම්බර් 27 දිනැති අංක පීඑෆ්/ 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් අරමුදල් කළමනාකරනයට අදාල මගපෙන්වීමක් ලබාදී තිබුණි. ඒ අනුව අරමුදල් 60 ක පමණ අධීක්ෂණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බව කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි. ඉහත චක්‍රලේඛය ප්‍රකාරව, අරමුදල් සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ද, මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තා මුදල් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙතද, ලබා දිය යුතුව තිබුණි. විගණිත දිනය වූ 2016 ජුලි 04 දින වන විටත් අරමුදල් 18 ක මූල්‍ය ප්‍රකාශන එසේ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2006 දෙසැම්බර් 27 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් තවදුරටත් පවත්වා ගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තුව වෙත අදාළ හේතු දක්වමින් වාර්තා කළ යුතු බව සඳහන් කර තිබුණි. දඹුල්ල හැර අනෙකුත් ආර්ථික මධ්‍යස්ථාන පෞද්ගලික නීතිඥවරයෙකු මාර්ගයෙන් සකස් කළ ඔප්පුවකින් පමණක් භාර අරමුදලක් පිහිටුවා ක්‍රියාත්මක කෙරෙමින් පැවතුණු අතර ආර්ථික මධ්‍යස්ථාන 03 ක් එසේ සකස් කළ ඔප්පුව හෝ දෙපාර්තමේන්තුව වෙත 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත්කර නොතිබුණි.

(ඉ) රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සේවා සැපයීමේදී අයකරනු ලබන ගාස්තු පිළිබඳ ක්‍රමවේදය වරින් වර සමාලෝචනය කරමින් සංශෝධනය කිරීම දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු කාර්යයක් වී තිබුණි. 2015 වර්ෂය අවසාන වන විටත් ආයතනවලින් ලැබෙන ඉල්ලීම් මත, එක් අයිතමයක් හෝ කිහිපයක් පිළිබඳව පමණක් සමාලෝචනය කිරීම සිදු කර තිබුණි. මේ නිසා ඉල්ලීම් ඉදිරිපත් නොවුනු සමහර ආයතනවලින් අයකරනු ලබන ගාස්තු සංශෝධනය නොවී දිගු කලක් පැවතීමෙන් මේ මගින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ඊ) රාජ්‍ය ආයතන සතු වත්කම් නිසි පරිදි කළමනාකරණය කිරීම මගින් එහි ආරක්ෂාව තහවුරු කිරීම මෙන්ම, අතිරික්ත හා ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීම මගින් රජයට ලැබිය යුතු ආදායම් වැඩි කිරීමේ ක්‍රමවේදයන් සැකසීම දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් යෝජනා 8.51 අනුව රාජ්‍ය ආයතන සතු අබලන් වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන අපහරණය කිරීම සඳහා උපදෙස් ලබා දෙමින් දෙපාර්තමේන්තුව විසින් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන චක්‍රලේඛය නිකුත් කර තිබුණි.

චක්‍රලේඛය ප්‍රකාරව, අපහරණය කළ යුතු යැයි හඳුනාගන්නා වාහන, චක්‍රලේඛය නිකුත් කළ දින සිට මාස 03 ක් ඇතුළත අදාළ විධිවිධානවලට අනුකූලව අපහරණය කර අවසන් කළ යුතුව තිබුණි. 2015 වර්ෂයේදී එසේ ආයතන 172 ක් වාහන 2668 ක් අපහරණය කළ යුතු ලෙස හඳුනාගෙන තිබුණත්, වාහන 2236 කට අදාළව කටයුතු 2015 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(උ) ඉහත චක්‍රලේඛය ප්‍රකාරව, යම් කිසි ආයතනයක අපහරණය කළ යුතු වාහන නොමැති නම්, ඒ බවද අනිවාර්යයෙන්ම 2015 ජූලි 30 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතු වුවද, ආයතන 261 ක වාර්තා එසේ ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) විගණකාධිපතිවරයා විසින් විවිධ රාජ්‍ය ආයතන සම්බන්ධව ඉදිරිපත්කරන ලද විගණන වාර්තා පිළිබඳව හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝගය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පසුවිපරම් කටයුතු සිදු කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් වී තිබුණි. විගණකාධිපති වාර්තා සම්බන්ධව පසුවිපරම් ලිපි පමණක් අදාළ ආයතන වෙත යැවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. එසේම 2015 වර්ෂයේ දෙපාර්තමේන්තු 52 කට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම් වාර පවත්වා තිබුණත්, කාරක සභා වාර්තා සටහන් 27 ක් පමණක් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු අතර ඊට අදාළ පසුවිපරම් කටයුතු සිදු කර ඇති බව විගණනයට දන්වා තිබුණි. එය පැවැත්වූ රැස්වීම් වාරවලින් සියයට 52 ක් පමණක් විය. කෙසේ වුවද 2016 වර්ෂයේ ලැබී ඇති විගණන වාර්තා සම්බන්ධ පසුවිපරම් කටයුතු සිදු කිරීමේදී පසුවිපරම් සඳහා යොමු කර ඇති විගණන වාර්තා සංඛ්‍යාව 86 ක් වුවද, ඉන් 02 කට පමණක් පිළිතුරු ලැබී තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 27 | 18 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 35 | 31 | 05 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 17 | - | - |
| | එකතුව | 83 | 67 | 17 | 01 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). වර්ෂ ගණනාවක් මුළුල්ලේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහකාර තනතුර යටතේ නිලධාරීන් තිදෙනෙකු පත් කර තිබුණත්, ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ii). ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2 ක පුරප්පාඩු පැවතියද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමාලෝචිත වර්ෂය තුළදී විදේශීය වැඩමුළු, පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා පෞද්ගලික සංචාරයන් සඳහා විදේශගත වූ අවස්ථා 29 ක් නිරීක්ෂණය විය. මේ නිසා තනතුරු දෙකක පුරප්පාඩු පැවැතිම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපෑමක් සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.